# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 02/2019

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2019 ජනවාරි මස 29 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම</u>

2019/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා පහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2019/01/10 වන දින පැවැති සිය 1001 වැනි සභා වාරයේ දී තීරණය කරන ලදි.

2. විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල නිර්දේශය අනුව සහ මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල එකඟ වී ඇති පරිදි මහපොළ ශිෂ්‍යත්ව මාසික වාරිකය ශිෂ්‍යත්වලාභීන්ගේ බැංකු ගිණුම්වලට සෘජුවම බැර කෙරේ.

   සෑම මාසයකම මහපොළ ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලැබූ සිසුන්ගේ ලැයිස්තුව විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල නිර්දේශය සහිතව මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත යොමු කළ යුතුය.

   මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා වන මාර්ගෝපදේශ, මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙත බෙදා හරිනු ලැබේ.

3. මහපොළ ශිෂ්‍යත්වයේ භාණ්ඩාගාර දායක මුදල් ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල්, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් නිර්දේශ කරන පරිදි මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සිදු කරන දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත සෘජුවම යොමු කරනු ලැබේ.

   මහපොළ භාණ්ඩාගාර දායක මුදල් ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් නිර්දේශ කිරීම සඳහා වන ආකෘතිය ඇමුණුම I හි දක්වා ඇත.

4. ඇමුණුම 1 හි දක්වා ඇති ආකෘතියට අනුව **"මාසික ගෙවීම් නිර්දේශය"** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරන මෙන් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

5. මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් සෑම මසකම 15 වන දින මහපොළ ශිෂ්‍යත්ව මාසික ගෙවීම සිසුන්ගේ බැංකු ගිණුම් වෙත බැර කළ යුතුය. පහත දැක්වෙන කාලරාමුව දැඩිව පිළිපදින මෙන් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ.

| | ක්‍රියාකාරකම | කාලරාමුව |
|---|---|---|
| 01 | විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් මහපොළ ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගේ නිර්දේශිත ලැයිස්තුව මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත යැවිය යුතුය. | පෙර මාසයේ 20 වන දින<br>එනම් : ගෙවීම් මාසය: අප්‍රේල්<br>පෙර මාසය : මාර්තු |
| 02 | මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ගෙවීම් කාල සටහන් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙත යොමු කළ යුතුය. | පෙර මාසයේ 30 වන දින |
| 03 | විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් මාසික ගෙවීම් නිර්දේශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය. | ගෙවීම් මාසයේ 5 වන දින<br>උදා :- අප්‍රේල් |
| 04 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සිට මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත අරමුදල් මාරු කිරීම. | ගෙවීම් සිදු කරන දිනට දිනයකට පෙර |
| 05 | මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් මහපොළ ශිෂ්‍යත්ව මාසික වාරිකය සිසුන්ගේ බැංකු ගිණුම්වලට බැර කළ යුතුය. | ගෙවීම් මාසයේ 15 වන දින |

මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු දැන ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර 011-2123485 යන දුරකථන අංකය ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී අමතන්න.

අ.කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්: 1. ලේකම්/නගර සැලසුම්, ජාල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
3. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උප-සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
5. ලේකම්/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ/ මහපොළ භාර අරමුදල
7. පීඨාධිපතිවරුන්
8. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
9. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්

11. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
13. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
14. අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
15. විගණකාධිපති

ලිපිගොනු අංක.යූ.ජී.සී./එෆ්9/ශිෂ්‍යාධාර/2018

## මාසික ගෙවීම් නිර්දේශය - මහපොළ ශිෂ්‍යත්වය

විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය : ..........................................................................................

මාසය : ..................................................................

| අධ්‍යයන වර්ෂය | | .................................... | | | .................................... | | | .................................... | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පියයේ නම | වාරික අගය | වාරික ගණන | සිසුන් ගණන | අගය | වාරික ගණන | සිසුන් ගණන | අගය | වාරික ගණන | සිසුන් ගණන | අගය |
| | | | | | | | | | | |

මහපොළ ශිෂ්‍යත්වය සඳහා ............................................ මාසයට අදාළ භාණ්ඩාගාර දායකත්ව මුදල රු.................................... වන අතර ඒ සඳහා මහපොළ භාර අරමුදල වෙත අරමුදල් යොමු කිරීමට මෙමගින් නිර්දේශ කරනු ලැබේ.

.......................................................
මූල්‍යාධිකාරී

.......................................................
ලේඛකාධිකාරී

.................................................................
උප කුලපති/අධ්‍යක්ෂ/මණ්ඩපාධිපති

.......................................................
දිනය